**දුරකථන** /தொலைபேசி இல./Telephone Nos.

**අමාත්‍යතුමා**
அமைச்சர்
Minister } 2784832
Fax: 2784825

**ලේකම්**
செயலாளர்
Secretary } 2784812

**කාර්යාලය**
அலுவலகம்
Office } 2785141-50
Fax: 2784846

**ඊමේල්**/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

**ඔබේ අංකය**
உமது இல.
Your No. } ....................

**අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி அமைச்சு
Ministry of Education

**"ඉසුරුපාය"**
**බත්තරමුල්ල.**

'இசுருபாய'
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.


**මගේ අංකය**
எனது இல.
My No. } ඊඩී/1/පිරි/1/108/උප

දිනය
திகதி
Date } 2007.04.20

චක්‍රලේඛ අංක 2007/08

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
..............................

## <u>ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවයේ අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය සහ උසස්වීම් පටිපාටිය සංශෝධනය කිරීම</u>

ශ්‍රී ලංකා රජයේ ගුරු සේවයට සමාන්තරව 1994-10-06 දින සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවයට පරිවේණාචාර්යවරුන් අන්තර්ග්‍රහණය කිරීමේදී සිදුව තිබෙන විෂමතා කීපයක් ඉවත් කිරීම සඳහා ද පරිවේණාචාර්යවරුන්ගේ සේවා උසස්වීම් ලබා ගැනීමේ ක්‍රියාවලිය වඩාත් නිවැරදි කිරීම සඳහා ද ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවා නියෝග පහත සඳහන් පරිදි නැවත සංශෝධනය කිරීමටත් පරිවේණාචාර්යවරුන්ගේ උසස්වීම්වලට අදාල ව පහත සඳහන් පූර්ව අවශ්‍යතාවන්ගෙන් නිදහස් කිරීමට ත් 2007 පෙබරවාරි මස 28 වැනි දින රැස්වූ අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබේ. එම තීරණ පදනම් කොට ගෙන ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවයට පරිවේණාචාර්යවරුන් අන්තර්ග්‍රහණය කිරීම හා එම සේවයේ උසස් කිරීම සඳහා පහත සඳහන් උපදෙස් අනුගමනය කිරීමට කටයුතු කල යුතුය.

02. ඒ අනුව ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවයට පරිවේණාචාර්යවරුන් අන්තර්ග්‍රහණය කිරීමේදී මෙතෙක් පැවති චක්‍රලේඛ උපදෙස් අභිබවා පහත තීරණ ක්‍රියාත්මක කල යුතුය.

i. 1994-10-06 දිනට පෙර පරිවේණාචාර්යවරයෙකු ලෙස ස්ථිර පත්වීමක් ලැබූ අයෙකු එම පත්වීම ලැබීමට පෙර පිළිගත් උපාධියක් ලබා සිටියේ නම් එම පත්වීම අනුව වැඩ භාරගත් දින සිට ම ස්ථිර උපාධිධාරී පරිවේණාචාර්යවරයෙකු ලෙස සලකා ශ්‍රී ලංකා පරිවේණාචාර්ය• සේවයට අන්තර්ග්‍රහණය කිරීම ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවයේ උසස්වීම් සඳහා එකී සේවා කාලය උපාධිධාරී පරිවේණාචාර්ය සේවා කාලයක් සේ සලකා කටයුතු කිරීම හා ඒ අනුව හිමිවන වැටුප් 2004-12-31 දින දක්වා හිඟ වැටුප් ගෙවීමකින් තොරව 2005-01-01 දින සිට ගෙවීම.

ii. 1994-10-06 වැනි දිනට වයස අවුරුදු 45 ක් වූ හෝ ඊට වැඩි සියලුම වෘත්තීය සුදුසුකම් රහිත උපාධිධාරී පිරිවෙණාචාර්යවරුන් වෘත්තීය සුදුසුකම් සහිත උපාධිධාරී පරිවෙණාචාර්යවරුන් සේ සලකා ශ්‍රී ලංකා පරිවෙණාචාර්ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම හා ඒ අනුව හිමිවන වැටුප් 2004-12-31 දක්වා හිග වැටුප් ගෙවීමකින් තොරව 2005-01-01 දින සිට ගෙවීම.

iii. 1994-10-06 දින වන විට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 37/92 අනුව ගෞරව උපාධිධාරීන් ලෙස සලකා වැටුප් ගෙවනු ලැබූ සියලුම උපාධිධාරී පරිවෙණාචාර්යවරුන් ගෞරව උපාධිධාරී පරිවෙණාචාර්යවරුන් සේ සලකා ශ්‍රී ලංකා පරිවෙණාචාර්ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම සහ ඒ අනුව හිමිවන වැටුප් 2004-12-31 දින දක්වා හිග වැටුප් ගෙවීමකින් තොරව 2005-01-01 දින සිට ගෙවීම.

iv. ශ්‍රී ලංකා පරිවෙණාචාර්ය සේවයේ උසස්වීම් පටිපාටියට අදාල ව උසස්වීම් සඳහා ප්‍රමාණවත් ලකුණු උපයාගත් සියලුම ශ්‍රේණිවලට අයත් පරිවෙණාචාර්යවරුන් ශ්‍රී ලංකා පරිවෙණාචාර්ය සේවා නියෝග මාලාවේ සඳහන් (i) වෘත්තීය සමාලෝචන (ii) සේවාස්ථ පැසි සඳහා සහභාගිත්වය (iii) කඩඉම් විභාගය සමත්වීම යන අවශ්‍යතාවන්ගෙන් නිදහස් කොට 2004-12-31 තෙක් අදාල ඉහල පන්ති/ශ්‍රේණි සඳහා උසස්වීම් ලබා දීම හා ඒ අනුව හිමිවන වැටුප් 2004-12-31 දක්වා හිග වැටුප් ගෙවීමකින් තොරව 2005-01-01 දින සිට ගෙවීම.

v. යම් පරිවෙණාචාර්යවරයෙකුට ශ්‍රී ලංකා පරිවෙණාචාර්ය සේවයේ උසස්වීම් සඳහා ලකුණු ලබා දීමේදි 1994-10-06 දිනට පෙර පැවති නුපුහුණු පරිවෙණාචාර්ය සේවා කාලය සඳහා අවුරුදු දෙකකට ලකුණු 01 බැගින් ලබා දිය යුතු අතර ශේෂ වන නුපුහුණු සේවා කාලය මාස 12 කට හෝ ඊට වැඩි නම් අමතර ලකුණක් ලබා දීම හා සෙසු පුහුණු හෝ උපාධිධාරී පරිවෙණාචාර්ය සේවා කාලය සඳහා අවුරුදු එකකට ලකුණු 1 බැගින් ලබා දීම හා ඊට මාස 6 කට වැඩි මාස 12 කට අඩු වූ ශේෂ වූ කාලය සඳහා ලකුණු 1 ක් ලබාදීම.

vi. රජය පිලිගත් ආයතනයක කෘෂිකර්මය පිලිබඳ ඩිප්ලෝමාව කනිෂ්ඨ විශ්ව විද්‍යාලය ඩිප්ලෝමාව යන දැවුරුදු ඩිප්ලෝමාවක් හෝ තුන් අවුරුදු සෞන්දර්ය ඩිප්ලෝමාව මහරගම ගුරු විද්‍යාලයේ විද්‍යා ගණිත ඩිප්ලෝමාව යන ඩිප්ලෝමාවලින් එක් ඩිප්ලෝමාවක් හෝ කිපයක් ලබා 1994-10-06 දිනට පෙර පරිවෙණාචාර්ය පත්වීමක් ලැබූ පරිවෙණාචාර්යවරයෙකු එම පත්වීම අනුව වැඩ භාරගත් දින හෝ ඉහත සඳහන් සහතික ලැබූ දින යන දින දෙකෙන් පසුව එලඹෙන දින සිට පුහුණු පරිණෙනාචාර්යවරයෙකු ලෙස සලකා ශ්‍රී ලංකා පරිවෙණාචාර්ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම හා උසස්වීම් සඳහා පුහුණු පරිවෙණාචාර්යවරයෙකු ලෙස සලකා කටයුතු කිරීම හා ඒ අනුව හිමිවන වැටුප් 2004-12-31 දින දක්වා හිග වැටුප් ගෙවීමකින් තොරව 2005-01-01 දින සිට ගෙවීම.

03. **ශ්‍රී ලංකා පරිවෙණාචාර්ය සේවා නියෝග සංශෝධනය කිරීම.**

මෙහි පලමුවැනි වගන්තියේ සඳහන් 2007 පෙබරවාරි මස 28 වැනි දින අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ශ්‍රී ලංකා පරිවෙණාචාර්ය සේවා නියෝග මාලාවේ ii වැනි කොටසේ 3(අ) වගන්තිය ඉවත් කර පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කෙරේ.

i. ස්ථිර සේවයේ සැම පුහුණු ඩිප්ලෝමා වෘත්තීය සුදුසුකම් සහිත/රහිත උපාධිධර පරිවෙණාචාර්යවරයෙකුට සහ ඒ හා සමාන සුදුසුකම් ලත් පරිවෙණාචාර්යවරයෙකුට සේවා කාලයේදි එක් අවුරුද්දකට එක බැගින් ලැබෙන ලකුණු ද මෙහි දැක්වෙන පරිදි සැම වසරක් සඳහා ම ලකුණු 1 බැගින් ලබා දීමේ දි ඉතුරු වන ශේෂය මාස 6 ක් හෝ ඊට වැඩි නම් එකී සේවා කාලය වෙනුවෙන් තවත් එක් ලකුණක් ලබා දිය යුතුය.

ii. පුහුණු පරිවේණාචාර්යවරුන්ගේ පුහුණු සහතිකය වලංගු වන දිනට පෙර ස්ථිර සේවා කාලයේ ගුරු විදුහල් පුහුණු කාලය ද ඇතුලත් වන සේ අවුරුදු දෙකකට එක ලකුණ බැගින් ලැබෙන ලකුණු ද එසේ ලකුණුලබා දීමේදී ඉතිරි වන ශේෂය වසරක් හෝ එයට වැඩි නම් එකී සේවා කාලය වෙනුවෙන් තවත් එක් ලකුණක් ද ලබා දිය යුතුය.

iii. උපාධිධාරි පරිවේණාචාර්යවරුන්ගේ උපාධි පත්වීමට පෙර ස්ථිර සේවයේ පුහුණු වන කාලය ද ඇතුලත් වන සේ වසර දෙකකට එක් ලකුණක් බැගින් ලැබෙන ලකුණු ද එසේ ලකුණු ලබා දීමේදී ඉතිරි වන ශේෂය වසරක් හෝ ඊට වැඩි නම් එකී සේවා කාලය වෙනුවෙන් තවත් එක් ලකුණක් ද ලබා දිය යුතුය.

iv. උපාධි පරිවේණාචාර්යවරුන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා උපාධිය සමත් වන්නේ නම් ඒ සඳහා එක් වරක් පමණක් ලැබෙන ලකුණක් ද ලබාදිය යුතුය යන පිළිවෙලට ලකුණු උපයා ගත හැකි වේ.

## 04. නිදහස් කිරීම

ඉහත සඳහන් 2007 පෙබරවාරි 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවයේ යම් පන්තියක / ශ්‍රේණියක සිටින ඊට ඉහළ පන්තියට / ශ්‍රේණියට උසස්වීම් ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් ලකුණු උපයාගත් පරිවේණාචාර්යවරුන් නියෝග මාලාවේ සඳහන් පරිදි ඉටු කළ යුතු හෝ සමත් විය යුතු පහත සඳහන් අවශ්‍යතාවන්ගෙන් 2004-12-31 දක්වා නිදහස් කොට අදාල ඉහළ පන්ති / ශ්‍රේණි සඳහා උසස්වීම් ලබා දිය යුතුය.

(i) වෘත්තීය සමාලෝචනය
(ii) සේවාස්ථ සැසි සඳහා සහභාගිත්වය
(iii) කඩඉම් විභාගය සමත්වීම

## 05. පරිවේණාචාර්ය සේවා උසස්වීම් ලබාදීම

ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවා නියෝග මාලාවේ විධිවිධාන හා ඉහත කාරණය පිළිබඳ ව 2007 පෙබරවාරි 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2004-12-31 තෙක් පමණක් මතු දැක්වෙන පරිදි කටයුතු කිරීම අනුමත කර ඇත.

i. ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවයේ 3 වැනි පන්තියේ ii වැනි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද ගුරු පුහුණු සහතිකයක් / බාහිර උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකමක් මෙතෙක් උපයා නොගත් නුපුහුණු පරිවේණාචාර්යවරයෙකු වේ නම් එම පරිවේණාචාර්යවරයාගේ නුපුහුණු පරිවේණාචාර්ය සේවා කාලය වර්ෂ 10 සපිරෙන දිනට හෝ 1994-10-06 යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට අනෙකුත් සුදුසුකම් නොසලකා ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවයේ 3 වැනි පන්තියේ 1 වැනි ශ්‍රේණියට උසස් කිරීම.

ii. ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවයේ 3 වැනි පන්තියේ i වැනි ශ්‍රේණියේ පුහුණු නුපුහුණු ඩිප්ලෝමාධාරීන් හා වෘත්තීය සුදුසුකම් රහිත උපාධිධාරීන් යන වර්ග තුනට අයත් ගුරු භවතුන් හා ඒ හා සමාන සුදුසුකම් ලත් ගුරු භවතුන් 3 වැනි පන්තියේ සේවා කාලය තුළ උපයා ගත් ලකුණු 05 ක් ලැබූ දිනට හෝ 1994-10-06 යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට අනෙකුත් සුදුසුකම් නොසලකා 2 වැනි පන්තියේ ii වැනි ශ්‍රේණියට උසස් කිරීම.

iii. ශ්‍රී ලංකා පරිවේණාචර්ය සේවයේ 2 වැනි පන්තියේ ii වැනි ශ්‍රේණියේ පුහුණු නුපුහුණු ඩිප්ලෝමාධාරීන් හා වෘත්තීය සුදුසුකම් සහිත උපාධිධාරීන් යන පරිවේණාචාර්යවරුන් සහ ඒ හා සමාන සුදුසුකම් ලත් පරිවෙනාචාර්යවරුන් අතරින් 2 වැනි පන්තියේ ii වැනි ශ්‍රේණියේ දී ලකුණු 10 ක් උපයාගත් පරිවේණාචාර්යවරුන් අනෙකුත් සුදුසුකම් නොසලකා ඉහත ලකුණු 10 උපයාගත්

දින හෝ 1994-10-06 යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට 2 වැනි පන්තියේ i වැනි ශ්‍රේණියට උසස් කිරීම.

iv. ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවයේ 2 වැනි පන්තියේ 1 වැනි ශ්‍රේණියේ සිටින පුහුණු, පුහුණු ඩිප්ලෝමාධාරීන් වෘත්තීය සුදුසුකම් සහිත උපාධිධාරීන් සහ ඒ හා සමාන සුදුසුකම් ලත් පරිවේණාචාර්යවරුන් අතරින් 2 වැනි පන්තියේ 1 වැනි ශ්‍රේණියේ සේවා කාලය තුළ දී ලකුණු 05 ක් උපයාගත් පරිවේණාචාර්යවරුන් අනෙකුත් සුදුසුකම් නොසලකා ඉහත ලකුණු 05 උපයා ගත් දින හෝ 1994-10-06 දින යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට 1 වැනි පන්තියට උසස් කිරීම.

v. ඉහත සඳහන් 2007 පෙබරවාරි 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් පරිවේණාචාර්ය භවතුන්ගේ උසස්වීම් සඳහා බලපානු ලබන ඉහත 4 වැනි වගන්තියේ සඳහන් සියලුම අවශ්‍යතා 2004-12-31 දක්වා නිදහස් කොට ඇත. ඒ අනුව ඉහත අවස්ථාවලදී උසස්වීම් ලබා දිය යුතු දිනය 2005-01-01 හෝ ඊට පෙර දිනයක් විය යුතු අතර 1994-10-06 හෝ ඊට පසු දිනයක් වීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබූ 2005-01-01 ට හෝ ඊට පෙර දිනයක විශ්‍රාම ලබා ඇති පරිවේණාචාර්ය භවතුන්ටත් මෙය යථා යෝග්‍ය පරිදි අදාළ කර ගත යුතුය.

06. මෙම චක්‍රලේඛ විධිවිධාන අනුව අන්තර්ග්‍රහණය කිරීමෙන් හෝ උසස්වීම් ලැබීමෙන් පරිවේණාචාර්ය භවතුන්ගේ වැටුප් වැඩිවන විටක 2004-12-31 දක්වා හිඟ වැටුප් ගෙවීමකින් තොරව 2005-01-01 දින සිට වැටුප් හිමිකම් ලබා දිය යුතුය. ඉහත උසස්වීම් සිදු කිරීමෙන් අනතුරුව වැටුප් සකස් කළ යුත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/94 සහ 7/2000 මගින් සංශෝධිත ආයතන සංග්‍රහයේ vii වැනි පරිච්ඡේදයේ 5 වැනි වගන්තිය අනුවය.

07. මෙම චක්‍රලේඛන ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය වන අතිරේක මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය ගණනය කොට අමාත්‍යාංශය වෙත දැනුම් දී අමතර ප්‍රතිපාදන ලබා ගැනීමෙන් පසුව පමණක් වැටුප් වැඩිවීම් ගෙවීමට කටයුතු කරන්න.

08. මෙහි දැක්වෙන සංශෝධන හා ඊට අදාළ උපදෙස් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ලබා සිටිනා සියලු ම පරිවේණාචාර්යවරුන්ට උසස්වීම් ලබා දීමට නොපමාව කටයුතු කරන්න.

09. මෙම චක්‍රලේඛයේ සඳහන් වන විධිවිධාන පරිදි කටයුතු කිරීමේදී යම් ගැටලුවක් වෙතොත් මා විමසන ලෙස ද වැඩිදුරටත් දන්වමි.

S. Thillainadarajah

එස්. තිල්ලෙයි නඩරාජා
වැ.බ. අධ්‍යාපන ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් ඃ-

1. ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යාපන අමාත්‍යාංශය - දැ.ගැ.ස. හා අ.ක.ස.
2. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ/විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස. හා අ.ක.ස.
3. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.ස. හා අ.ක.ස.
4. කොට්ඨාස භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.ස. හා අ.ක.ස.
5. පිරිවෙන් අධ්‍යාපනය භාර නි.අ.අ./ස.අ.අ. වරුන්
6. කෘත්‍යාධිකාරී/පරිවේණාධිපති හිමිවරුන්.